ලංකාදීප - 05.03.2005

# ආසියාවේ නායකත්වය කොයිබටද?

**පාර්ලිමේන්තු මන්ත්‍රී මිලින්ද මොරගොඩ මහතා ද සහභාගී වූ සිංගප්පූරුවේදී පැවැති ලෝක ප්‍රසිද්ධ ''හෝ රී වා'' දේශන මාලාව සඳහා මලයාසියාවේ හිටපු අග්‍රාමාත්‍ය ආචාර්ය මහතීර් මොහොමඩ් මහතා කරන ලද මෙම දේශනය ඇසුරෙන් සකස් කරන ලද මෙම ලිපිය ලංකාදීප පත්‍රයට එවන ලද්දේ ද මිලින්ද මොරගොඩ මහතා විසිනි.**

මොනයම් සංවිධානයක හෝ කාර්යයක නායකයකුගේ සුවිශේෂ වගකීම ගැන විවාදයක් නොමැත. වර්තමානයේදී ඡන්දදායකයන්ට තම නායකයා හෝ නායිකයින් වශයෙන් කවුරුන් තෝරා පත්කර ගත යුතුද යන අවබෝධය තිබෙන බව මගේ විශ්වාස යයි. ප්‍රජාතන්ත්‍රවාදය පදනම් වී ඇත්තේ මේ අදහස මතය.

ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය අනුව තම නායකයන් තෝරාපත් කර ගැනීමට ජනතාවට ඉඩ දී ඇත. නායකයන් තෝරාපත් කර ගතයුතු වන්නේ ඔවුන්ගේ ගුණධර්ම ගැන මහජනතාවට ඇති අවබෝධය මත විය යුතුය. මහජනතාව විසින් තෝරා පත් කරගන්නා නිසා එම නායකයන් අනිවාර්යයෙන්ම ජනතාවගේ යහපත උදෙසා කැපවිය යුතුය.

බලසම්පන්න ප්‍රජාතන්ත්‍රවාදී රටවල් විසින් අනුමත කරන එකම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි. වෙනත් ක්‍රමයකට ඉඩ නැත. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කිරීමට අපොහොසත්වීම හේතුවෙන් ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිවන පක්ෂ පමණක් නොව අහිංසක හෝ එසේ නොවන සියලු දෙනාටම දඬුවම් විඳීමට අද සිදුවී තිබෙන බව පෙනේ. ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිවන ස්ත්‍රීන් දරුවන්, මහල්ලන් හෝ රෝගීන් වශයෙන් කිසිම අයෙකුට ගැලවීමට නොහැකි බව පැහැදිලිය. ප්‍රජාතන්ත්‍රවාදීව නායකයින් තෝරාපත් කර නොගතහොත් ඒ සියලු දෙනාටම දඬුවම් විඳීමට සිදුවේය යන්න දැන් ලෝකයේ සිදුවීම් අනුව පෙනෙන කාරණාවයි.

ප්‍රජාතන්ත්‍රවාදී නොවන එවැනි රටවල්වලට එරෙහිව සම්බාධක පැනවීම බාධක ඇති කිරීම් ආක්‍රමණ හා බලයෙන් යටපත් කරගැනීම් වැනි බලපෑම් දකින්නට ලැබේ. ඒවා කරන්නේ බටහිර ප්‍රජාතන්ත්‍රවාදී රටවල උවමනාවටය. මෙම සියලු ක්‍රියාවලි ප්‍රජාතන්ත්‍රවාදයට එරෙහිවන අය වෙත පමණක් බලපාන්නේ නම් කම් නැත. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී නොවන බව දැනගෙනත් තම රජයන් පෙරලා දැමීමට නොහැකිව සිටින සාමාන්‍ය ජනාවටද මේ නිසා ඉමහත් පීඩාවන් ඇති වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදය පිටස්තර බලකිරීමෙන් නොව මහජනතාව තුළින්ම මතුවිය යුතු බව ප්‍රජාතන්ත්‍රවාදීව නොසිතීම කුතුහලයකි. ස්ත්‍රීන් දරුවන්, මහළු අය රෝගීන් මරණයට ලක් කිරීමද නිරාහාරකොට වෛද්‍ය ප්‍රතිකාරද අහිමි කිරීම, ප්‍රජාතන්ත්‍රවාදී ඉලක්කය සපුරාලීමේ මාර්ගයක් වශයෙන් යුක්ති සහගත බව බටහිර ලෝකය පෙන්වා දෙයි. ඉලක්කය ප්‍රජාතන්ත්‍රවාදී රජයක් ස්ථාපිත කිරීමට නම් මිනීමැරුම්, ඝාතන, නිවාස විනාශ කිරීම්ද යුක්ති සහගතය. මෙම සියලු උපක්‍රම අසාර්ථක වුවත් ප්‍රජාතන්ත්‍රවාදය අත්කර ගැනීමේ පරමාර්ථය වුවද යුක්ති සහගත කරන බව අද ලෝකයෙන් හඳුනාගත හැකිය.

ජපානය දෙස බලන්න. පරමාණු බෝම්බ දෙකකින් පසුව ඔවුන් සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍රවාදීවී ඇත. අවසාන ප්‍රතිඵලය මහජනතාව වෙනුවෙන් වූ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම නම් රටක් කුසගින්නේ තබා වෛද්‍ය ප්‍රතිකාර වළකමින් බෝම්බ හෙලීම හා රොකට් ප්‍රහාර එල්ල කිරීම වරදක්ද? මහජනතාව වශයෙන් හඳුන්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රචලිත කරන්නන්ගේ නිර්දේශයෙන් සම්මත ජනකොටසයි.

ප්‍රජාතන්ත්‍රවාදී රටක තම නායකයන් තෝරාපත් කර ගැනීමේ අයිතියෙන්ම පමණක් මිහිපිට ස්වර්ගයක් නිර්මාණය වීම සත්‍යයක්ද? යන්න අපි විමසා බැලිය යුතුය.

බොහෝ ආසියානුවන්ට ප්‍රජාතන්ත්‍රවාදය ගැන අවබෝධයක් නොමැති බවටත් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාදාමයෙන් ඇතිවන ප්‍රතිඵල ගැන නොදන්නා බවටත් බොහෝ සාක්ෂි ඇත.

යුරෝපීය ජාතිකයන්ගේ පැරණි ප්‍රජාතන්ත්‍රවාදයෙහි ඕනෑම අයෙකුට නායකයෙකු වීමේ අවස්ථාව තිබූ හෙයින් සියලු දෙනාටම නායකයකුවීමේ අවශ්‍යතාවයක් නොවීය පක්ෂ දෙකක් හෝ තුනක් පමණක් ක්‍රියාකාරීවීමෙන් එක් පක්ෂයකට බහුතරයක් ලබාගෙන විශ්වාසී වූ බලවත් රාජ්‍යයක් පිහිටුවීමේ හැකියාව තිබුණි.

නමුත් ආසියානුවෝ සිය ගණනක් නායකයන් වීමට ඇති ලොල්කම නිසා පක්ෂ ගණනාවක් බිහිකිරීමේ උවමනාවට ගොදුරු වී සිටිති. මෙම හේතුවෙන් ඡන්ද දායකයින් පක්ෂ ගණනාවකට බෙදී සිටී. වැඩිවශයෙන් ජාති, ආගම් හෝ පළාත්බෙදීම් අනුවද මත සංකල්ප අනුවද එසේ නැතහොත් යම් අයෙකුට ධනවත් නම් පක්ෂයක් බිහි කිරීමේ හැකියා වන්ගෙන්ද යුක්තව සිටින බව අද ආසියාවෙන් දැකිය හැකිය.

ඡන්දයෙන් හොඳම අපේක්ෂකයින් තෝරාපත් කරගනු නොලැබේ. අල්ලස්දීමෙන් මැරබලයෙන්, චරිත ඝාතන කිරීමෙන් සහ අනිකුත් නොහොබිනා උපක්‍රම වලින් රටක් මෙහෙයවීමට නුසුදුසුම අපේක්ෂකයනට ජයග්‍රහණය කළහැකි වී තිබේ. ඡන්ද දායකයෝද අපේක්ෂකයන් භය ගැන්වීමෙන් සහ අල්ලස් ඉල්ලා සිටීමෙන් අවස්ථාවෙන් ප්‍රයෝජන ගනිති. තවද විශේෂයෙන්ම රජයේ අපේක්ෂකයන්ගෙන් ඉතා හාස්‍යයට පත් කරන තරම් ඉල්ලීම් ඉදිරිපත් කරති. ගමෙහි හෝ ඡන්ද කොට්ඨාශයේ නායකයන් තම සාමාජීය ප්‍රතිරූපය සිටුවීමට අවශ්‍යතාවයන් හෝ වෙනත් අනවශ්‍ය ව්‍යාපෘති ඉල්ලා බලපෑම් කරති. අපේක්ෂකයන් වෙනුවෙන් ප්‍රචාරක වැඩකටයුතු වල යෙදෙන වැඩිහරියක් දෙනා තමන් පසුම්බිය මුදල් ඔපයා ගැනීමේ අරමුණින් මුදල් ද ඉල්ලා සිටිති. සමහර විට පක්ෂ ක්‍රියාකාරී යන්ත්‍රය ඡන්ද ව්‍යාපාරය මැද කඩා වැටේ. නැවත පණගැන්වීමට මුදල් ඡන්ද පොරොන්දු සහ කාලය අවශ්‍ය වනු ඇත. තවත් සමහර අවස්ථාවන්හි බලවත් ප්‍රාදේශීය නායකයින් තම අපේක්ෂාවන් බිඳවැටීම හේතුවෙන් තමන්ගේ සහයෝගය නොදෙන බවට අනතුරු අඟවති. එවිට ඔවුන් දිරිගැන්වීම සඳහා තවත් මුදල් අවශ්‍ය වනු ඇත.

තියුණු තරගයකදී මහජනතාවගේ සෑම ඡන්දයක්ම වැදගත්ය. අපේක්ෂකයන්ට හා පක්ෂවලට තම පාක්ෂිකයින් අමනාප කරගත නොහැක. එක් පාක්ෂිකයෙකු ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයෙකුට සම්බන්ධ වුවහොත් වැඩිවාසි ලබාගැනීම සඳහා ඒ වෙනුවට වෙනත් දෙදෙනෙකු බඳවා ගත යුතුව තිබේ. සෙසු අපේක්ෂකයෝ පුද්ගලිකව කොතරම් නුසුදුසු වුවත් සුළු ඡන්ද දායකයින් කොටසකගේ අවශ්‍යතාවයන් සහ අනතුරු හැඟවීම් වලට අවනත නොවන අපේක්ෂකයාට පාඩමක් ඉගැන්වීම පිණිස ඔවුහු ප්‍රතිවිරුද්ධ අපේක්ෂකයාට සහයෝගය දක්වති. බහුතරය ජයග්‍රහණය කරන්නේ නැත. තියුණු තරගයක ජයග්‍රාහකයා පත්කරනු ලබන්නේ සුළු පිරිසකගේ කපටිකමයි. මෙය ප්‍රජාතන්ත්‍රවාදයයි එය ඇත්තක්ද?

මැලේසියාවේ දේශපාලන කටයුතු විරාමයක් නොමැතිව දිගටම පවතී ඡන්ද ප්‍රතිඵල ප්‍රකාශ කිරීමත් සමගම නැවත පවත්වන ඊළඟ මැතිවරණයේ ප්‍රචාරක කටයුතු ආරම්භ කිරීම සඳහා එය සම්බන්ධය සමහර පක්ෂ සිකුරාදා සමූහ යාඥා මෙහෙයක් අතරතුරේ දෛනිකව පවත්වන යාඥා මෙහෙයත් අතර තුළදීත් මැතිවරණ ප්‍රචාරක කටයුතු වලයෙදී සිටී. ඉරු උදාවේ සිට මධ්‍යම රාත්‍රියට පසුවත් ශබ්ද විකාශන යන්ත්‍ර තුළින් ආණ්ඩු විරෝධී ප්‍රචාරක කටයුතුවල යෙදෙති.

සමහරු එය ගණනකට නොගත්තත් මරණයෙන් පසු ඇතිවන එලදීම් සම්බන්ධයෙන් වූ දේශන තද ආගමික අනුගාමිකයන්ට ඡන්දය ඉදිරියේ ඉමහත් බලපෑමක් ඇතිකරයි. එහි ප්‍රතිඵලයක් අනුව මැතිවරණයෙකදී ඡන්දය පාවිච්චි කරනු ලබන්නේ නායකත්වය දැරිය යුතු අයට නොව මහජනතාව නොමග යවන අයටය. ඒ හේතුවන් රජයට හා පාලන පක්ෂයට මැතිවරණ අතරතුර කාලයේදී සෑමදිනකම ප්‍රචාරක කටයුතුවල යෙදීමට සිදුවේ. ප්‍රතිඵලය රටපාලනයටත් සංවර්ධනයටත් කැපකළ යුතු වටිනා කාලය සහ ශ්‍රමය අවසානයක් නොමැති දේශපාලන ප්‍රචාරවලට මිඩංගු කිරීමට සිදුවීමයි. ප්‍රජතන්ත්‍රවාදය

පවතින සමහර රටවල පක්ෂ ගණනාවක් තරග කිරීමෙන් අල්ලස භීෂණය, දූෂණය, යන හේතූන් මතුවීම නිසා ප්‍රජතන්ත්‍රවාදී ඡන්දයකදී හොඳ නායකයන්ගෙන් යුත් ශක්තිමත් රජයක් පිහිටුවීම අසීරුය.

රජය දුර්වලනම් හොඳ නායකයන්ටද ප්‍රතිඵල නෙලාගත නොහැක. තමන් කරන කාර්යයන්ට සහය ලැබේද? එම කාර්යයන් ඉටුකිරීමට නැවත තෝරාපත් කරනු ලැබයිද යන අවිශ්වාසයෙන් ඔවුහු නිරන්තර කනස්සල්ලකින් පසුවෙති. දුර්වල ආණ්ඩු වීදි කෝලාහල, වැඩ වර්ජන යනාදී කැළඹිලි වලින් පෙරළා දැමිය හැක. ප්‍රතිඵලය ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාකූලත්වයයි. ප්‍රමාණය ඉක්මවූ ප්‍රජාතන්ත්‍රවාදයෙන් බොහෝ රටවල මහ ජනතාව සෑහෙන දුක්විඳිති.

අනිත් අතින් සමහර ආසියාතික රටවල් තම නායකයින් ඒකාධිපතිවරුන් විය හැකිය යන බියෙන් ව්‍යවස්ථානුකූලව නායකයකු එක් පාලන කාලයකට පමණක් සීමා කර ඇත. නමුත් එක් පාලන කාලයක් තුළ දීම සංවර්ධන ප්‍රතිඵල ලබාගත හැක්කේ ප්‍රාතිහාර්යන් තුළින් පමණි. සංවර්ධනය වෙමින් පවතින රටකට පත්වන නව නායකයින් විසින් තම ප්‍රතිරූපය නගාසිටුවීම සඳහා වසර පහෙන් පහට නව සැලසුම් ක්‍රියාත්මක කිරීමෙන් සිදුවන්නේ රටේ සංවර්ධනය අඩාලවීම පමණකි. රටට නායකත්වය දීම සම්බන්ධයෙන් අවබෝධයක් ඇති කර ගැනීම සඳහා වසරක් ගනු ඇත. තම ප්‍රතිපත්ති නිර්මාණය කර පාර්ලිමේන්තු සහාය ලබා ගැනීමට තවත් වසර දෙකක් ගනු ඇත. ඉතිරිව ඇති වසර දෙකක කාලය ප්‍රතිඵල ලබාගැනීමට තියා ප්‍රතිපත්ති හෝ වැඩසටහන් නිස් පරිදි ක්‍රියා කරවීමටවත් නොසෑහේ.

සමහර ආසියානු රටවල් තම නායකයින්ට ව්‍යවස්ථා තුළින් සීමාරහිත කාලයක් ලබාදෙති. සෑම මැතිවරණයකදීම ජනතාව තම නායකයාට හා පක්ෂයට බහුතර ඡන්දයෙන් රාජ්‍ය බලය ලබාදෙති. එක් පක්ෂයක් වැඩි කාලයක් එක දිගට බලය දැරීම ප්‍රජාතන්ත්‍රවාදී නොවන බවට මතයක් පවතී. නමුත් සාධාරණ ලෙස පවත්වන ඡන්දයකදී මහජනතාව විසින්ම එම පක්ෂය හා නායකත්වය නැවතත් තෝරාපත් කර ගැනීම ප්‍රජාතන්ත්‍රවාදයට අනුකූල නොවේද කිසි විටෙක දූෂිත නායකත්වයක් හෝ පක්ෂයක් මහජනතාව නැවත නැවතත් තෝරාපත් කර ගන්නේ නැත.
හොඳ නායකයින් බිහිකිරීමට ඇති ප්‍රබලම ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයයි. නමුත් ප්‍රායෝගිකව එය එසේ වන බවට සහතිකයක් අද නොමැත.

ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආසියානු රටවල් වලින් විශිෂ්ඨ නායකත්වය ලබාදුන් හොඳ නායකයන් බිහිවී ඇත. මෙම රටවල් තමස්ථාවර පැවැත්ම තුළින් මතු බලාපොරොත්තු උපදවන හොඳ සංවර්ධනයක් ලබාගෙන ඇත. නමුත් අද මෙම රටවල්ද ප්‍රජාතන්ත්‍රවාදී වියයුතු යන බලපෑමට ලක්වී සිටිති. නමුත් මෙය නිවැරදි නොවේ. මහජනතාවටම තම නායකත්වය හෝ ක්‍රමය තෝරා පත් කර ගැනීමේ අයිතිය සතු විය යුතුය.

අවාසනාවකට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය ගැන ඇති සීමිත දැනුම නිසා නව ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් සහ ජනතාව අර්බුදකාරී තත්ත්වයක් ඇති කිරීමට දායකවී ඇත. උදාහරණයක් වශයෙන් අද ඉරාකයේ තත්ත්වය ප්‍රජාතන්ත්‍රවාදී නොවූ කාලයටඩා යහපත් යයි කිව නොහැකිය. අද පවතින්නේ සිවිල් යුද්ධයකි. අහිංසක ජනතාවගේ ජීවිත විනාශ වී හෝ ආබාධිත වී ඇත. සියලු සැපයීම් අඩාලවී ඇත. ජන ජීවිතයට අවශ්‍ය මූලික පහසුකම් අක්‍රීයව පවතී. ආර්ථිකය ප්‍රපාතයට ලක්ව ඇත. ඉරාකය නැවත ගොඩගැනීමට වසර ගණනාවක ස්ථාවර පසුබිමක් අවශ්‍ය වනු ඇත. එම ස්ථාවරය කොපමණ කලක් තුළ ඇතිවේද යන්න කිසිවෙකුට කිව නොහැකිය.

ආසියාවේ කොටසක් වන මැද පෙරදිග ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ ඉරාක පාලන වෙනසකින් විපර්යාසයක් ඇති කරන බවට ආක්‍රමණිකයින් පවසා ඇතත් ඉරාකයේ දැන් ස්ථාපිත කර ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී නොවන රජයකි. ඉරාකයේ සිද්ධීන්ට සාක්ෂි දරන අනිකුත් රටවල් ප්‍රජාතන්ත්‍රවාදය වෙත යොමුවීම විශ්වාස කළ නොහැකි කාරණාවකි. එරට නිදහස් ඡන්ද පැවැත්වුවහොත් දැඩි ලෙස ඇමෙරිකානු විරෝධි පක්ෂ හෝ කණ්ඩායම් ජයගන්නා බව වැඩි විශ්වාසයයි. ඇමරිකානුවන් මෙය පිළිනොගනිමින් රාජ්‍ය පාලනය වෙනස් කිරීම සඳහා නව ප්‍රයත්න වෙත යොමුවෙනවා ඇත.

යුරෝපයේ වාර්ගික ප්‍රජාතන්ත්‍රවාදී ලිබරල් නායකයන් සුපුරුදු පරිදි මතවාදයේ අරමුණ පටලවා ගත්හ. සමාජවාදය සහ කොමියුනිස්ට්වාදය බිහි කර ඇත්තේ ජනතාවගේ යහපතට මිස මතවාදයේ යහපත නිසා ජනතාව බිල්ලට දීමට නොවන බව අමතකවීම හේතුවෙන් සියදහස් ගණනක ජනතාවක් සටන් වලින් මරුමුවට පත් වූහ. වාර්ගික යුරෝපානුවන්ට මේ ස්වභාවය තේරුම් ගැනීමට වසර 70ක් ගතවී තිබේ.

එදා සිදුවූ වැරදි වර්තාමානයේද එලෙසම සිදුවෙමින් තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක කරවීම සඳහා මහ ජනතාව බොහෝ පරිත්‍යාග කරනු ලබයි. ප්‍රජාතන්ත්‍රවාදී නොවන පාලන ක්‍රම තුළ හිතකර ජන ජීවිතයක් ගොඩනැගී ඇතත් එය විනාශකර ක්‍රියාකාරිත්වය හරිහැටි ජනතාව නොදන්නා පවතින ජීවන තත්ත්වයට වඩා සමහර විට අහිතකර ප්‍රතිඵල ගෙන දෙන ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයට ඉඩදීමට ඇතැම් විට සිදුවේ.

ඈත සහ මෑත යුගවලදී තම රටවල් සහ ජනතාව නවීන ලෝකය කරා රැගෙන යාම ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආසියානු නායකයින් අතින් සිදුවී ඇත. ජපානයේ මෙයිජී අධිරාජ්‍යයා සියමේ රජවරු, තායිවානයේ චියන්කයි ෂෙක්, චීනයේ ඩෙං සියාවෝ පෙං, දකුණු කොරියාවේ පාක් චුං හි සියලු දෙනාම ආඥාපතිවරු ලෙස තම රටවල් පාලනය කර ඇත. ස්ථාවර බලයක් රහිතව ජනතාව විසින් පත්කළ නායකයින් වශයෙන් ඔවුන්ට එම සේවාවන් ඉටුකිරීම එදා ඔවුන්ට සිහිනයක් වෙන්නට තිබුණි.

වාර්ගික යුරෝපානුවන් මෙම කියමන හාස්‍යයට ලක්නොකර තම රටවල් සෞභාග්‍යමත් කරවීම සඳහා ලෝකයේ විශාල පෙදෙස් ප්‍රමාණයන් යටපත් කරගෙන ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් උදුරමින් ඇතිකල වැඩවසම් කාලය දෙස ආපසු හැරී බැලිය. ඔවුන් තවමත් විශ්වාස කරනුයේ අන් රටවල් වල ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළින් ඇතිකරවීමට නොහැකි නම් තම පරමාර්ථයක් සපුරා ගැනීම සඳහා බලය යොදවමින් රටවල් සහ වැසියන් සම්පූර්ණයෙන් විනාශ කිරීමේ අයිතිය තමන්සතු බවයි.

සමහර ආඥාදායක ආසියානු නායකයින් තම රටවල් දියුණුවීම වළක්වන බව පිළිගත යුතුය. නමුත් බොහෝ ආසියානු රටවල් සංවර්ධනය නොවන්නේ එය තම නායකයින් ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රජාතන්ත්‍රවාදයි නොවන මාර්ගයන් තුළින් බලය ලබා ගැනීම සඳහා වැඩි කාලයක් යොදවන බැවිනි. මහ ජනතාවට රජයක් මාරුකිරීමට බලය ඇතත්, රජයේ පීඩා වලින් නිදහස් වී ඇතත්, ආර්ථික අහේනිය නිසා දිළිඳුකමින් නිදහස් වී නැත. ණය වහලුන් බවට පත් කරන විදේශික ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන් තම පීඩනයන් තුළින් මෙම තත්ත්වය උග්‍රකොට ඇත.

ආසියානුවන් සහ ආසියානු නායකයින්ට පිටතින් තමන්ට යොමුවන අදහස් සහ සංකල්ප දෙස විවේචනාත්මක ලෙස බැලීමට අවශ්‍ය චින්තන හෝ කල්පනා නිදහස නොමැත. දැනටත් ඔවුන්ගේ යොමුවීම වාර්ගික යුරෝපයක් දෙසය. වාර්ගික යුරෝපිකයින් ඔවුන් බලාපොරොත්තු වන තත්ත්වයට සෙසු රටවල් වලට ළඟාවීමට නොහැකිවීම අවාසනාවක් ලෙස සලකති.

ප්‍රජාතන්ත්‍රවාදයේ ශ්‍රේෂ්ඨත්වය නගාසිටුවීමේදී ආසියාව ඔවුන් පවසන්නේ උත්සාහ දරන බවයි. ගෝලීයකරණය නිදහස් වෙළඳාම සහ මායිම් නැති ලෝකයක් යෝජනා කළ විට ප්‍රතිචාරය වූයේ යටහත් පිළිගැනීමයි. ප්‍රතිඵලයක් වශයෙන් බලසම්පන්න දේශයන්ට නිදහස් රටවල අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමේ අයිතිය, අවි පරීක්ෂා කිරීමේ අයිතිය අභ්‍යන්තර පාලන වෙනස් කිරීමේ අයිතිය, සම්බාධක පැනවීමේ අයිතිය, ආක්‍රමණය කිරීමේ සහ බලයෙන් ප්‍රජාතන්ත්‍රවාදී කිරීමේ අයිතියද සතු කරගත්හ. මෙම ක්‍රියා කලාපයට එරෙහිවීමක් තවමත් නොමැත. ඇතැම් ආසියාතික රටවල්වල සමහරු ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රමයන් තුළින් ආසියාව ප්‍රජාතන්ත්‍රවාදී කිරීමේ යුරෝපීන්ගේ උත්සාහයන්ට උවමනාවෙන්ම සහාය වෙති.

ආසියානු රටවල් හැටක් ඔවුන්ටම පාලනය කරගත නොහැකි අසාර්ථක රටවල් ලෙස බටහිර ලෝකය හඳුන්වාදී ඇත. එම රටවල් අනිවාර්යෙන්ම රාජ්‍ය පාලන මාරුවකට ලක්විය යුතුව ඇතැයි ඔවුන්ගේ අදහසයි.

මෙම අදහස් සංකල්ප හෝ ක්‍රම කිසිවක් ආසියානු නායකයින් විසින් ප්‍රකාශ කරනු ලැබූ හෝ ආසියාවෙන් බිහිවූවක් නොවේ. වසර පනහකට පමණ පෙර ඉන්දුනීසියාවේ ජනාධිපති සුකර්නෝ යටත්විජිත රාජ්‍ය අදහස පළකළේය. නමුත් මෑත කාලයේදී කිසිවෙකු එවැන්නක් ප්‍රකාශ කර නොමැත.

අපි වාර්ගික යුරෝපිකයන්ගේ පිටස්තර අදහස්වලට අවනතවීමේ කාර්යෙහි යෙදී සිටීමට උත්සාහ දරන්නෙමු. කොමියුනිස්ට් වාදයට සිදුවූ පරිදි වාර්ගික යුරෝපානුවන්ට ප්‍රජාතන්ත්‍රවාදය එපාවී එම ක්‍රමයට ආයුබෝවන් කියන තෙක් එය අප ඉවසා සිටිය යුතුය. අද සිදුවන්නේ එයයි.

නමුත් අවධාරණයෙන් කිවයුතු කාරණාවක් ඇත. ශිෂ්ඨාචාරය අසියාවෙන් පටන්ගත් බව බටහිර දැනගත යුතුය යන්න එයයි. වාර්ගික යුරෝපානුවන් සත්ව හම් වලින් නිරුවත වසා සිටි සමයේ ආසියානුවන් සංකීර්ණ පාලන ක්‍රමයක් තුළින් තම පෙදෙස් පාලනය කළ බවට සාක්ෂි ඇත. ආසියානු නායකයින් යටතේ දැනුම සහ කලාව වර්ධනය විය. ශ්‍රේෂ්ඨ දේශයන් සහ අධිරාජ්‍යයන් ගොඩනංවා පාලනය කළහ. නමුත 'අද ආසියානුවන් බටහිර ලෝකය විසින් තමන් පාලනය කරනු ලබනු තෙක් බලා සිටී අද අප කතා කළ යුතුද යන්න ගැනත් වාර්ගික යුරෝපානුවන්ගෙන් අවසර ගත යුතුය. යුරෝපීය සංගමය සහ නැ'ටෝ පිහිටුවීමෙන් අනතුරුව අත්‍යාවශ්‍ය වූ නැගෙනහිර ආසියානු ආර්ථික සන්ධානයක් පිහිටුවීම සඳහා ඇමෙරිකාවේ නිල අනුමැතිය ලැබෙන තෙක් යටහත් පහත්ව බලා සිටියෙමු. අප දැනටත් නැගෙනහිර ආසියාවේ සන්ධානයක් ලෙස හඳුන්වා නොදෙමින් ආසියාන් 1+3 පිටුපස සැඟවී සිටිමු.

පෘතුගීසීන් පැමිණුමෙන් අනතුරුව ආසියානු නායකත්වයේ ආරම්භක ශක්තිය හීනවී ඇත. අපට තව කොපමණ කලක් බිය වී සිටිය යුතුවේද යන්න මම නොදනිමි. ඇත්ත වශයෙන්ම අප විදේශීය ආධිපත්‍යයට යටත්ව සිටිමු. අප නිදහස් නැත. නිසැකවම අපේ මනස එම ආදිපත්‍යයන්ට යටත්වී ඇත. මනස යටත් වූ පසු ශරීරය යටත් කර ගැනීමේ අවශ්‍යතාවයක් පැන නොනැගේ.

අද වන විට ආසියානුවන් විශ්වාසී වූ දේශයකින් විශ්වාසී වූ නායකයකු පැමිණෙන තුරු බලා සිටින බව මට විශ්වාසයි. වාර්ගික යුරෝපානුවන්ට කත් අදින අයට විරුද්ධව දිනකදී ජනහඬ නැගෙනු ඇත. ත්‍රස්තවාදී හෝ වෙනත් ක්‍රියාවන්හි යෙදෙනු ඇත. ආසියානු නායකයින් මෙය වටහාගත යුතුය. නීත්‍යානුකූලව පිහිටුවන ලද රජයක් තම රටටත් ජනතාවටත් අසාර්ථකවීම මූලික වගකීම් අසාමාන්‍ය අය වෙත පැවරීමට කාරණාවයි. අසාමාන්‍ය අය පිළිවෙත් අනුගමනය නොකරති. ඔවුන්ට එරෙහිව පිළිගත් අවි ආයුධ වලින් හෝ පිළිගත් ක්‍රමවලින් සටන් කළ නොහැක. ඔවුන් යුද්ධ නිම කිරීමට සාම ක්‍රියාදාමයන්ට එකඟ නොවනු ඇත. ඔවුන්ගේ ක්‍රියාකාරීකම් නිම වන්නේ ජන අයිතීන් සහ යුක්ති සාධාරණය නැවත ලබා දීමෙන් හා රාජ්‍ය බලයද සැබෑ නිදහසද නැවත ලැබීමෙන් පසුවයි.

ආසියානු නායකයින්ට තෝරාගැනීමේ අවස්ථාවක් ඇත. එනම් අදහස් සහ සිතුවිලි සම්බන්ධව මූලික ශක්තිය තුළින් සත්‍ය නායකත්වයක් ඉදිරියට ගෙනයමින් ආත්ම ගෞරවය නැවත ස්ථාපිත කිරීමය. එසේ නැත්නම් නිගරු විදේශීය ආධිපත්‍යයට නිගරුත්වයට යටත්වී ජනතාවගේ අවමානයට ලක්වීමයි.